# උතුරු පැරමැටා සිංහල පාසල
# 1 වන පුවත් ලිපිය – 1996

## සංස්කාරකගෙන්

මේ වසරේ සිට දෙමවුපියන් වෙත යවන පත්‍රිකා හැකි සෑම අවස්ථාවකදීම සිංහල භාෂාවෙන් මුද්‍රණය කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මේ අපගේ පළමු ප්‍රයත්නයයි.

වසන්ත සපරමාදු

## සභාපතිගෙන්

පළමුවෙන්ම මෙම තනතුරේ වගකීම මට භාර දීම ගැන පැරමැටා සිංහල පාසලේ ගුරු දෙගුරුන්ට ස්තුති කරන අතර, හැකි පමණින් මගේ වගකීම ඉටු කරන බවට මම සහතික වෙමි. මෙම වසරේදී ඔබ සියලු දෙනාගේ සහාය මේ සඳහා කමිටුවට ලැබෙන බව මට විශ්වාසය.

මෙම වසර ඇරඹුන විගසින් අප පාසලෙන් පෙබරවාරි 4 දින නිදහස් උත්සව දිනය සඳහා සංස්කෘතික අංගයන් දෙකක් පමණ ඉදිරිපත් කරන ලෙස SPUR සංගමය මගින් ඉල්ලීමක් කෙරිනි. එවිට පාසල් නිවාඩු කාලය වූ බැවින් ඒ සඳහා ඉදිරිපත් වීමට වැඩි දෙනෙක් නොවූහ. මෙම අංග දෙක සංවිධානය කළ මංජුලා විජේරත්න සහ අනුලා රන්දෙනි මහත්මීන්ට මම පාසල වෙනුවෙන් ස්තුතිය සහ ප්‍රශංසාව පිළිගැන්වීමට කැමැත්තෙමි. මංජුලා "උතුරු නැගෙනහිර බටහිර ..." ගායනයට අනුකූලව රංගනයක් දරු දැරියන් ලවා ඉදිරිපත් කළ අතර අනුලා "නිදහසෙන් පසු ..." නමින් කෙටි ඉතිහාසාත්මක ඉදිරිපත් කිරීමක් දරු දැරියන් ලවා කළාය. ඉතා කෙටි කාලයක් තුල මෙම අංග දෙක පුහුණු කිරීමට සහාය දුන් දෙමවුපියන්ටත් සහභාගිවූ දරු දැරියන්ටත් අපගේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.

මෙම වසරේදී අපගෙන් බැහැර වූ ජයන්තා විජේසිංහ, ටජ්මා වුලතුංග සහ පාලිත ගනේවත්ත ගුරු මහත්ම මහත්මීන්ට ඔවුන්ගෙන් වූ සේවයට අපගේ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. ඔවුන්ට සුභ අනාගතයකට පාසල වෙනුවෙන් මම ආසිරි පතමි.

1996 පෙබරවාරි 4 දින පැවැත්වූ කමිටු රැස්වීමේදී මෙම වසරේදී විවිධ ප්‍රසංගයක් සියලු පාසල් සමග එක්ව පවත්වනු ලැබේනම් එයට අප පාසලෙන්ද ඉදිරිපත් වීමට තීරණය කරන ලදී. සියලු අංගයන් ඉදිරිපත් කිරීමේදී දෙමවුපියන් විසින් ප්‍රධාන වගකීම දැරීම සහ සංවිධානය කිරීම කළ යුතු බවද තීරණය විය. මේ ගැන වැඩි විස්තර ඔබට පසුව දැනුම් දෙන්නෙමි.

පසුගිය වසරේදී අප සංගමයේ ආර්ථික තත්වය හොඳ වූ බැවින්, ගිය වාර්ෂික සභාවේ අනුමැතිය ලැබුනද පාසල් ගාස්තු වැඩි කිරීම ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. අපගේ අරමුණ දෙමාපියන්ට ඇතිවන විය හියදම් හැකි පමණ අඩු කිරීමයි. 1994 සහ 1995 වසරවලදී දෙමවුපිය කමිටුවකින් සංවිධානය වූ වසර අවසන් සාදයන්ගෙන් ලැබූ මුදලද අපගේ ගිනුම්වලට බැර කර ඇත.

තවද ප්‍රාන්ත රජයේ නව ප්‍රතිපත්තියක් මත මවු භාෂා ඉගැන්වීම සඳහා රජයේ පාසල් යොදා ගැනීමේදී ඒ සඳහා මුදල් අය කිරීම මෙම වසරේ සිට අත්හිටවූ බැවින් ඒ සඳහා අපට වියදමක් දැනට නැත. විදුහල්පතිනිය විසින් කුඩා කාමර දෙක මෙවර අප වෙත නොදී ඇති බැවින් තාවකාලික අපහසුතාවයක් දැනට ඇතිවීම ගැන මගේ කනගාටුව පුද කරමි. ඉදිරි දෙමස ඇතුලත වැඩි ඉඩක් (යාබද ගොඩනැගිල්ලේ) ලබා ගැනීමට අපි කටයුතු කරන්නෙමු.

සරත් විජයපාල

## උප සභාපතිගෙන්

තවත් නව වසරකට උතුරු පැරමැටා සිංහල පාසල පිය නගන මේ අවස්ථාවේ, පසුගිය වසරේ පාසල පවත්වාගෙන ගිය ගුරු දෙගුරු කමිටුවට අපගේ ස්තුතිය පිරිනැමේ. මේ වසරේ කමිටුව පහත සඳහන් දෙමවුපියන් ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| සරත් විජයපාල (සභාපති) | සිරි කමලසූරිය |
| කමල් ප්‍රනාන්දු (උප සභාපති) | වසන්ත සපරමාදු |
| ලක්ෂ්මන් වනිගනායක (භාණ්ඩාගාරික) | මොහාන් සෙනෙවිරත්න |
| කාන්ති මාතරආරච්චි | අතුල ගිනිගේ (අධ්‍යාපන උප කමිටුවේ නියෝජිත) |

මේ වසරේ තවත් පියවරක් ඉදිරියට තබන උතුරු පැරමැටා සිංහල පාසල 7 වන වසර සඳහාද පන්ති පවත්වනු ලැබේ. මේ වසරේ ගුරුවර ගුරුවරියන්ගේ නම් පහත සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| පහළ බාලාංශය | - ජෝයි ධම්මපාල | 4 වන වසර | - මංජුලා විජේරත්න |
| ඉහළ බාලාංශය | - ශාන්ති සේනාධීර | 5 වන වසර | - නාමලී ජයසේන |
| 1 වන වසර | - කලණි ප්‍රනාන්දු | 6 වන වසර | - ස්ටේපල්ස් ගුණරත්න |
| 2 වන වසර | - ශ්‍යාමා රත්නායක | 7 වන වසර | - ඉරන්දතී ප්‍රේමචන්ද්‍ර |
| 3 වන වසර | - දයාංගනී සෙනෙවිරත්න | | |

අපේ පාසල සාර්ථකව පවත්වා ගෙන යාමට අපට අතිරේක ගුරුවර ගුරුවරියන් අවශ්‍ය වී ඇත. මේ සඳහා ඉදිරිපත් වීමට කැමති අය දුරකථන අංක 897 2351 වලින් මට දැනුම් දෙන්න.

කමල් ප්‍රනාන්දු

## භාණ්ඩාගාරිකගෙන්

1996 පළමුවැනි අර්ධ වසර සඳහා පාසල් ගාස්තු ගෙවා නැති දෙමාපියන්ගෙන් එම ගාස්තු ඉක්මනින් ගෙවන ලෙස ඉල්ලා සිටිමු.

ලක්ෂ්මන් වනිගනායක

## පාසල් පුස්තකාලය

උතුරු පැරමැටා සිංහල පාසල් පුස්තකාලය 1996-2-18 දින සිට පාසල් සිසුනට පොත් ලබා ගැනීම සඳහා නැවත විවෘත වූ අතර සාමාන්‍ය පන්ති පවත්වන සෑම ඉරු දිනයකම දහවල් 12.00 - 12.30 අතර කාලය ඒ සඳහා වෙන්කර ඇත.

පසු ගිය අවුරුද්ද තුල පුස්තකාලය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා සෑම අයුරකින්ම උපකාර වූ ඔබ සැමට උතුරු පැරමැටා පාසල වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු. පුස්තකාලය සඳහා පොත් පරිත්‍යාග කළ දෙමවුපියන් විශේෂයෙන් අප මතක් කළ යුතුය.

තවමත් අප වෙත නැවත බාර නොදුන් පුස්තකාල පොත් කිහිපයක් ඇති අතර ඒවා හැකි ඉක්මනින් ලැබෙන්නට සලස්වන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමු. පොත් නිකුත් කිරීම නොකඩවා කරගෙන යෑමට මෙය අත්‍යවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.

තවද ඉදිරියට සිංහල සින්දු කවි යනාදිය අඩංගු පොත් එකතුවක් පිළියෙළ කිරීමට අදහස් කරන අතර ඒ සඳහා සින්දු සහ සංගීත ප්‍රස්ථාර ( Musical Notes - Eastern & Western ) ලබා දෙන ලෙස ඔබ සැමගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

කාන්ති මාතරආරච්චි

## වසර අවසාන පරීක්ෂණය – 1995

උතුරු පැරමැටා සිංහල පාසලේ වසර අවසාන පරීක්ෂණය 1995 නොවැම්බර් අවසානයේදී පවත්වනු ලැබීය. සම්මාන ලැබූ සිසුන් මෙසේය:

**පහළ බාලාංශය** පැමිණීම: හර්ෂන කිරිඇල්ල, පැතුම් වනිගසේකර, අශාන් ප්‍රනාන්දු, දසුන් ගිනිගේ, දිලන් වෙලන්ගොඩ, කශී සමරවීර

**ඉහළ බාලාංශය** විශිෂ්ඨ සම්මාන: විරංගි පල්ලෙවෙල, සුරංගි වීරසිංහ, ලීෂා මාරසිංහ. පැමිණීම: සාරා කමලසූරිය, විදීෂා සපරමාදු, තාමරී කුලරත්න. විශේෂ සහතිකය: මිෂෙල් මැකැවනා (Michell McCavana)

**1 වන වසර** දක්ෂතම ශිෂ්‍යයා: පේෂල කාරියවසම්. කියවීම: සචින්ත විජේසිංහ. කථනය: රුක්ෂාන් බන්ඩාර. විශේෂ උනන්දුව: මලිත් වීරකෝන්. ලිවීම: පේෂල කාරියවසම්. පැමිණීම: හසාරා ප්‍රනාන්දු, විසල් අලහේන්ද්‍ර, අමාලි සෙනෙවිරත්න. කෙටි කාලයකදී විශේෂ දියුණුව: ප්‍රමෝද් විජයපාල.

**2 වන වසර** දක්ෂතම සිසුවා: සමීර වනිගතුංග. කියවීම: සමීර වනිගතුංග. ලිවීම: දිනුශදි සමරවීර. කථනය: සමීර වනිගතුංග. උනන්දුව: චමී ප්‍රනාන්දු. පැමිණීම: සතුර ගුණතිලක, නාරද කිරිඇල්ල, හසන්ති පල්ලෙවෙල, නිශාන් සෙනෙවිරත්න, චමී ප්‍රනාන්දු, හසිත පෙරේරා.

**3 වන වසර** හොඳම ශිෂ්‍යයා: නුවන් ගිනිගේ. හොඳම ශිෂ්‍යාව: තිලිනි ජයවර්ධන. දක්ෂතම ශිෂ්‍යාව: සුරනි දිසානායක. කියවීම: අයංග වනිගතුංග. උනන්දුව: ශනාල් සෙනෙවිරත්න.

**4 වන වසර** හොඳම අත් අකුරු: නීශා සෙනෙවිරත්න. ගෙදර වැඩ: හර්ෂන් රන්දෙනි. පැමිණීම: ශලිනි නානායක්කාර.

**5 වන වසර** දක්ෂතම ශිෂ්‍යයා: චමිල වුලතුංග. නිර්මාණාත්මක කුශලතා: අනුක් අමරසිංහ. උද්‍යෝගිමත් ශිෂ්‍යයා: පසන් පෙරේරා. විශේෂ උනන්දුව: ජනේත් කුලරත්න.

**6 වන වසර** දක්ෂතම ශිෂ්‍යාව: නදීකා විජේසිංහ

5 වන වසරේ ඉගෙනුම ලැබූ චමිල වුලතුංග ශිෂ්‍යයා පසුගිය දෙසැම්බර් මසදී කරාටේ කළු පටියක් දිනා ගැනීම ගැන අපගේ සතුට ප්‍රකාශ කරමු.

සිරි කමලසූරිය